## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය - 2017

---

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය,හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 50(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත 2018 ජූනි 11 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ .

**2. මූල්‍ය ප්‍රකාශන**

----------------------

**2.1 තත්ත්වාගණනය කළ මතය**

-------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර**,** මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-----------------------------------------------

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

-----------------------------------------------

**ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

--------------------------------------------------

ප්‍රමිතයේ 69 ඡේදය ප්‍රකාරව වත්කමක ක්ෂය කිරීම ආරම්භ කළ යුත්තේ එය පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආ පසුව වුවද, 2017 දෙසැම්බර් 31 වන විටත් අධිකාරියට ලැබී නොතිබුණු රු.2,827,431 ක් වටිනා ජංගම නොවන වත්කම් සඳහා රු.282,743 ක් ක්ෂය ගණනය කර ගිණුම් ගත කර තිබුණි.

**2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

------------------------------

පශ්චාත් සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 හි 9 හා 15 ඡේද ප්‍රකාරව ප්‍රමිත නිර්මාණය කරන ආයතනවල වඩාත් මෑත කාලීන ප්‍රකාශ කිරීම් අනුව අනාගත සේවක වැටුප් වැඩිවීම, සේවක පිරිවැටුම හා අනෙකුත් ආයුගණක උපකල්පන පදනම් කරගෙන ප්‍රතිපත්තියක් සකස් කළ යුතු වුවත් එවැනි ප්‍රතිපත්තියක් සකස් කර ගෙන නොතිබුණි. එහෙත් සේවකයින් අවසන්වරට ලබාගත් වැටුප හා සේවා කාලය පදනම් කරගෙන පාරිතෝෂික සඳහා වෙන් කිරීම් සිදු කර තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනට එම විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන් කිරීම රු.1,583,778 ක් අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්යාල උපකරණ හා මෝටර් වාහන රු.3,518,530 කින් පිරිවැය ඉක්මවා ක්ෂය කර තිබුණි.

(ආ) 2014,2015 හා 2016 වර්ෂවලට අදාලව 2017 මැයි 30 දින ගෙවා තිබුණු රු.12,011,000 ක්වූ සේවක ප්‍රසාද දීමනා පෙර වර්ෂවල ලාභයට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. තවද මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂයට සේවක ප්‍රසාද දීමනා සඳහා ඇස්තමේන්තු පිළියෙල කර වෙන් කිරීම් සිදුකර නොතිබුණි.

## 2.3 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීතිරීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.5 වගන්තිය | 2017 දෙසැම්බර් 31 දිනට වැඩ තහනම් කරන ලද නිලධාරීන් 10 දෙනෙකුගෙන් එකතුව රු.881,760 ක් වූ ණය ශේෂයන් අයවිය යුතුව පැවතුනි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371(2) වගන්තිය | අත්තිකාරම් ලබා ගත් කාර්යය නිමවූ වහාම පියවිය යුතු වුවත් මානව සම්පත් විගණනය සඳහා පෞද්ගලික සමාගමකට ලබා දුන් රු.219,000 ක් වූ අත්තිකාරම 2018 ජුනි 30 දින වන විටත් පියවා නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.50,830,861 ක අතිරික්තයක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා වූ අතිරික්තය රු.6,660,137 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 44,170,724 ක වර්ධනයක් නිරීක්ෂණය විය. පුනරාවර්තන ප්‍රදාන රු.88,652,320 කින් වැඩිවීම හා පෞද්ගලික පඩිනඩි වෙනත් මෙහෙයුම් වියදම් හා ගොඩනැගිලි කුලී පිළිවෙලින් රු.34,361,943 කින්, 8,764,413 කින් හා රු.6,685,806 කින් වැඩිවීම මෙම වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 හි මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී සමාලෝචිත වර්ෂය දක්වා අඛණ්ඩ මූල්‍ය අතිරික්තයක් පැවතියද එය වාර්ෂිකව උච්ඡාවචනය වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේ රු.190,252,253 ක් වූ දායකත්වය 2017 වර්ෂයේදී රු.343,944,401 ක් දක්වා වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

### 4.1 කාර්යසාධනය

--------------------

#### 4.1.1 සැලසුම් කිරීම

--------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 300 ක් ඇතුළුව වැඩසටහන් 600 ක් නිම කිරීමට සැලසුම් කර තිබුණු අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.8,474,299 ක් වැය කර තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේදී එම වැඩසටහන් 105 ක් පමණක් පවත්වා තිබුණු අතර දිස්ත්‍රික්ක 03 ක කිසිදු පාසැල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වා නොතිබුණි.

(ආ) පැසැල් ළමුන් සංඛ්‍යාව පදනම් කරගෙන අදාල දිස්ත්‍රික්කවලට ප්‍රමුඛතාවය ලැබෙන අයුරින් හා සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි පාසැල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) 2007 ජුලි 11 දිනැති අංක 1505/11 දරන ගැසට් නිවේදනයේ සඳහන් භාණ්ඩ අලෙවි කරනු ලබන සියලුම ආනයනකරුවන් හා බෙදාහරින්නන් ඒ අනුව කටයුතු කරන්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා අධිකාරිය විසින් සමීක්ෂණයක් සිදු කර තිබුණි. එම සමීක්ෂණයේදී, ගැසට් නිවේදනයේ සඳහන් භාණ්ඩවල ආනයනකරුගේ, බෙදාහරින්නන්ගේ විස්තර සඳහන් නොකිරීම, උපරිම සිල්ලර මිල ලකුණුකර නොතිබීම, ඇතැම් භාණ්ඩ වල මිල මත නැවත කඩහිමියන් විසින් මිල සළකුණු කිරීම ආදී කරුණු නිරීක්ෂණය කර තිබුණු බැවින්, ඉහත ගැසට් නිවේදනයේ නියෝගයන් ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය වන අතර එම නියෝගයන් ක්‍රියාත්මක කරවීම සම්බන්ධයෙන් අධිකාරිය විසින් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(ඈ) අධිකාරිය පිහිටුවීමට අදාල පනතේ 13 වන වගන්තියෙන් අධිකාරිය වෙත ලැබෙන පැමිණිලි විසඳීම සම්බන්ධයෙන් විධිවිධාන පනවා තිබුණි. අධිකාරිය වෙත ලැබෙන පැමිණිලි හා ඒවා විසඳීම් පිළිබඳ ක්‍රමවත් ලේඛන හෝ දත්ත පද්ධතියක් පවත්වා නොතිබීම හේතුවෙන් නොවිසදූ පැමිණිලි පිළිබඳව හා විසඳීමේ ප්‍රමාදයන් පිළිබඳව පරීක්ෂා කිරීමට නොහැකි වන අතර මේ හේතුවෙන් පාරිභෝගික සුරාකෑම්වලට එරෙහිව සහනයක් ලබා දීම සහ පාරිභෝගිකයින්ගේ ජීවිත සහ දේපලවලට උපද්‍රවයන් සිදුවන භාණ්ඩ හා සේවා සැපයීමට එරෙහිව පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම යන අධිකාරියේ අරමුණු ඉටු කර ගැනීම බාධාවක් බව නිරීක්ෂණය වේ.

(ඉ) 2008 වර්ෂයේ සිට සහල් නිශ්චිත භාණ්ඩයක් ලෙස නම්කර තිබුණද, පනතේ 20(5) වගන්තිය ප්‍රකාරව සහල් වර්ග 3 ක් සඳහා වරින්වර උපරිම සිල්ලර මිල නියම කර ගැසට් නිවේදන නිකුත් කර තිබුණි. 2017 දෙසැම්බර් 26 දින නිකුත් කළ අංක 2051/8 දරන ගැසට් නිවේදනය මගින් නාඩු සහල් කිලෝග්‍රෑම් 1ක් සඳහා පමණක් උපරිම සිල්ලර මිල නියම කිරීම නිසා අනෙකුත් සහල් වර්ගවල සිල්ලර මිල පාලනයෙන් බැහැර වී තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය විසින් සිදු කළ මුළු වෙළඳසැල් වැටලීම් 25,605 න් සියයට 38 ක් භාණ්ඩ මිල ලකුණු කිරීම, ලේබල් කිරීම සහ ඇසිරීම සම්බන්ධයෙන්ද සියයට 26.98 ක් මිල ලැයිස්තුව ප්‍රදර්ශනය නොකිරීම සම්බන්ධයෙන්ද සිදු කර තිබුණි.

එසේ වුවත් ලකුණු කල මිලට වැඩි මිලකට විකිණීම, භාණ්ඩ හා සේවා සැපයීමට අදාල ප්‍රමිති හා පිරිවිතර, නිශ්චිත භාණ්ඩ හා සේවා වල මිල සහ උපරිම මිල නියම කළ භාණ්ඩ අලෙවි කිරීම සම්බන්ධයෙන් වැටලීම් සිදු කර තිබුණේ මුළු වැටලීම් වලින් පිළිවෙලින් සියයට 4.08, 0.48,0.06 හා 9.1 ක් වැනි අඩු ප්‍රමාණයක් විය. තවද අධිකාරි පනතේ 29 වන වගන්තිය අනුව වෙළෙන්දා විසින් දැන්වීම් ප්‍රවරුවක් සැපයීම සම්බන්ධයෙන් කිසිදු වැටලීමක් සිදු කර නොතිබුණි.

(උ) 2016 හා 2017 වර්ෂයන් වලදී සිදු කරනු ලැබූ වැටලීම් වලින් පිළිවෙලින් වැටලීම් 201 ක් හා 434 ක් සඳහා නඩු පවරා නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විධිමත් අනුමැතියකින් තොරව පත් කරන ලද උපදේශකයින් සඳහා වැටුප් හා දීමනා ගෙවීම නීත්‍යානුකූල නොවන බව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2016 අගෝස්තු 11 දිනැති අංක DMS/1736/VOL 1 දරන ලිපිය මගින් දන්වා තිබියදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ 2016 වර්ෂයේදී උපදේශකවරුන් 05 දෙනෙකු පත්කර තිබුණි. 2015 අප්‍රේල් 01 දිනැති අමප/15/0180/613/008 අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණය පදනම් කර ගනිමින් එම උපදේශකවරුන් බඳවාගත් දින සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා උපදේශන දීමනා, ඉන්ධන දීමනා හා ප්‍රවාහන දීමනා වශයෙන් රු.5,490,720 ක් ගෙවා තිබුණි.

(ආ) කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයට අයත් වාහනයක් අලුත්වැඩියා කිරීම සඳහා අධිකාරිය විසින් 2016 වර්ෂයේදී රු.2,275,187 ක් වැයකර තිබුණද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.3.1(අ) ඡේදය පරිදි අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. එම වාහනය මාස 08 ක් පමණක් පාවිච්චි කර නැවත එම අමාත්‍යාංශය වෙත භාර දී තිබුණි. 2017 ජුනි 15 දිනැති CAA/HRA/VEH/24 අංක දරන ලිපියේ මෙම අලුත්වැඩියා වියදම අමාත්‍යාංශයෙන් ප්‍රතිපූරණය කර ගැනීමට ඉල්ලුම් කර තිබුණද විගණිත දින වන විටත් අමාත්‍යාංශයෙන් එම වියදම ප්‍රතිපූරණය කරගෙන නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

----------------------------------

අධිකාරිය විසින් විවිධ හේතූන් මත අයකරන ලද දඩ මුදල් සම්බන්ධයෙන් උසාවි වලින් ලැබෙන ලේඛන හා ආයතනයේ පවත්වාගෙන යන ලේඛන වෙන් වෙන් වශයෙන් හඳුනා ගැනීමට නොහැකි වීම හේතුවෙන් 2016 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී හඳුනානොගත් දඩ මුදල් ශේෂය රු.796,003 සිට රු.10,006,585 දක්වාද ලැබිය යුතු දඩ මුදල් ශේෂය රු.4,229,491 සිට රු.14,635,071 දක්වා වැඩි වී තිබුණි.

## 4.4 කාර්යමණ්ඩල පරිපාලනය

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ද්විතියික පදනම මත හා වැඩ බැලීමේ පදනම මත අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා නිලධාරියකු පත්කර තිබුණු අතර 2010 මාර්තු 25 දින සිට ස්ථිර නිලධාරියකු පත් කර නොතිබුණි.

(ආ) දිස්ත්‍රික්කවල ඇති වෙළඳසැල් ප්‍රමාණය හා ජනගහනය පදනම් කරගෙන එක් එක් දිස්ත්‍රික්කවල අනුයුක්ත කළ යුතු විමර්ශන නිලධාරීන් ප්‍රමාණය තීරණය කර තිබුණද 2018 මාර්තු 28 දින වන විට දිස්ත්‍රික්ක 06 ක නිලධාරීන් 87 ක අතිරික්ත ප්‍රමාණයක්ද තවත් දිස්ත්‍රික්ක 06 ක නිලධාරීන් 92 ක ඌනතාවයක්ද පැවතුණි.

**5 තිරසාර සංවර්ධනය**

**5.1 තිරසාර සංවර්ධන අරමුණු කරා ළඟාවීම**

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව අධිකාරිය විසින් අරමුණු හා ඉලක්ක ලෙස පිළිවෙලින් "වගකීමෙන් යුතු පාරිභෝජනය හා නිෂ්පාදනය", "ගුණාත්මක බවින් ඉහළ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය හා බෙදාහැරීම" යන අරමුණු හඳුනාගෙන තිබුණු අතර එම අරමුණු හා ඉලක්ක මැනීම සඳහා අධිකාරය විසින් දර්ශක, සංධිස්ථාන හා පාදක දත්ත හඳුනාගෙන නොතිබුණි.

**6 ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**6.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද අධිකාරිය විසින් 2016 වාර්ෂික වාර්තාව විගණිත දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**7. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන පිළිබඳ අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | සේවක ණය අයකර ගැනීම | සේවක ණය අයකර ගැනීමට ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුගමනය නොකිරීම, සේවක ණය කාල විශ්ලේෂණයක් පිළියෙල නොකිරීම. |
| (ආ) | දඩ මුදල් එකතු කිරීම | දඩ මුදල් එකතු කර ගැනීම යාවත්කාලීන නොවීම |
| (ඇ) | නිලධාරීන් පුහුණු කිරීම | සියලුම නිලධාරීන් ආවරණය වන පරිදි පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක නොවීම. |
| (ඈ) | පැමිණිලි විසඳීම | පැමිණිලි ලිපිගොනු අසම්පූර්ණ හා යාවත්කාලීන නොවීම, පැමිණිලි විසඳීමේ ප්‍රමාදය හා වාර්ෂික ඉලක්කයන් ඇතිකර නොගැනීම. |